# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නැගෙනහිර බහළු පර්යන්තය (ECT) අදියර II ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. තනතුර : මිනින්දෝරු (POST OF SURVEYOR)**

අ) වැටුප

සාකච්ඡා කර ගිවිස ගත හැක.

ආ) යෝග්‍යතාවය

**අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක්

**හෝ**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ මැනුම් විද්‍යාව උපාධියට සමාන සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ලියාපදිංචි බලපත්‍රය සහිත මිනින්දෝරුවකු විය යුතුය.

**සමඟ**

**පළපුරුද්ද:**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු ජල ශාස්ත්‍රීය සමීක්ෂණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර එක (01) ක ක්‍රියාකාරී පළපුරුද්ද ඇතුළුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අට (08) ක පළපුරුද්දක් තිබිය යුතුය.

**සැලකිය යුතුයි**

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතික වල ඡායා පිටපත් සමග **ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13** යන ලිපිනයට ලැබෙන සේ 2022 – 12 – 09 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (slpahrex@slpa.lk) එවිය යුතුයි. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේ ද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**